**පරිසර අමාත්‍යාංශය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික/ තාක්ෂණික නොවන නිලධර ගණයේ III ශ්‍රේණියේ වනසත්ව අඩවි ආරක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024 (2025)**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ වනසත්ව අඩවි ආරක්ෂක තනතුරු පුරප්පාඩු 114 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **(පිරිමි අයදුම්කරුවන් පමණි.) අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේනතුවේ** www.doenets.lk **වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති " Online Applications – Recruitment Exams/E.B. Exams"** ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 දෙසැම්බර් මස 08 වැනි දින පෙ.ව.09.00 ට විවෘත වන අතර 2026 ජනවාරි මස 05 වැනි දින ප.ව. 09.00ට අවසන්වේ.** එසේම මෙම විභාගය **2026 මාර්තු මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තෝරාපත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානින් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

**01. වැටුප් ක්‍රමය :**

මාස 06 ක පුහුණු කාලය තුළ පුහුණුවන වනසත්ව අඩවි ආරක්ෂක තනතුර සඳහා රු. 22,500/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 3 –2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය - රු. 52,250 – 10x800 – 11x1,190 – 10x1,320 – 10x1,350 - රු. 100,040/- ක් වනඅතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ.

පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**02. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි:**

i. වනසත්ව අඩවි ආරක්ෂක තනතුර සඳහා තෝරාගනු ලබන සියලුම දෙනා පුහුණු වනසත්ව අඩවි ආරක්ෂක ලෙස මාස 06 ක පුහුණු කාලයකට යටත් වේ.

ii. පුහුණු පාඨමාලාව අවසන් කරන නිලධාරීන් වනසත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

iii. පුහුණුව සාර්ථකව අවසන් කිරීමට අසමත් වන හෝ පුහුණු කාලය තුළදී පුහුණුව අතහැර යන තැනැත්තකුට නැවත මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීම සඳහා කිසිදු හිමිකමක් නොමැත. ඒ සම්බන්ධව සිදුකරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

iv. වනසත්ත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් වේ. තව ද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු වේ. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

v. පත්වීම අවු. 03 ක පරිවාස කාලයකට යටත් වේ.

vi. වනසත්ත්ව අඩවි ආරක්ෂකයන්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි දුෂ්කර සේවා ස්ථාන වන අතර, තෝරා ගනු ලබන අපේක්ෂකයන් නියෝග කරනු ලබන පරිදි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

vii. *ගැසට්* පත්‍රයේ 2 ඡෙදයෙහි පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාළවන පොදු කොන්දේසි අදාළ වේ.

viii. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. **වයස් සීමාව:**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.01.05 දිනට වයස අවු.18 ට නොඅඩු සහ අවු. 30 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ නියතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ.) ඒ අනුව 2008.01.05 දිනට හෝ ඊට පෙර හා 1996.01.05 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අය පමණක් මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

**04. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබිය යුතු ය;

*සහ*

II. පැරණි විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථය සහිතව එක් වරක දී විෂයන් 04 කින් සමත්ව තිබීම;

*හෝ*

නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 03 කින් එක් වරකදී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

III. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

IV. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

V. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට තනතුර බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

VI. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

VII. පිරිමි අයදුම්කරුවන් පමණක් විය යුතු අතර, උස අඩි 05 යි. අඟල් 04 කට නොඅඩු විය යුතු ය. පපුව අඟල් 32 ක් විය යුතු ය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය:**

I. ඉහත 04 ඡෙදය යටතේ සුදුසුකම් ලබන, ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් ලබාගන්නා සමත් ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ මත බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබාගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ මත, නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ.

II. බඳවා ගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේදී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනකු සිටියහොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීම මගින් අවසන් පුරප්පාඩුව නොපිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

III. ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපිතව සකසන ලද ප්‍රතිඵල ලේඛනය වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට අයදුම්කරන ලද සියලු දෙනා හට පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk යන වෙබ් අඩවිය ඔස්සේ හෝ සිදුකරනු ඇත.

IV. පුහුණු කාල සීමාව සාර්ථක ලෙස අවසන් කරන අයදුම්කරුවන් වනසත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියට පත්වීමෙන් පසු වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමෙන් පසුව සහ වසර 03 ක සතුටුදායක සේවා කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

**06. විෂය නිර්දේශය:**

**I. ලිඛිත විභාගය :**

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය හා අවබෝධය | පැය 1 | 100 | 40% |
| 02. සාමාන්‍ය දැනුම හා වනජීවී සංරක්ෂණය | පැය 2 | 100 | 40% |

**බුද්ධි පරීක්ෂණය හා අවබෝධය :**

පද, සංඛ්‍යා, රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු විශේෂයකි. අපේක්ෂකයින් දක්වන අනුමාන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලුව පිළිබඳ අවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය සහ අවකාශය අතර සම්බන්ධතාව වටහා ගැනීමෙහිලා අපේක්ෂකයන්ගේ හැකියාව මනින කෙටි ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්න පත්‍රයකි.

**සාමාන්‍ය දැනුම හා වනජීවී සංරක්ෂණය :**

වනජීවී සංරක්ෂණය පිළිබඳ ජාතික කලාපීය හා සමස්ත ලෝකයේ සංවිධාන, පරිසරය පිළිබඳ දැනුම හා සමාජීය, සංස්කෘතික හා විද්‍යාත්මක, දේශපාලනික, ආර්ථික කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ දැනුවත්භාවය මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 2. භාෂා දැනුම | 10 |
| 3. පළපුරුද්ද | 20 |
| 4. වෘත්තීය සුදුසුකම් | 30 |
| 5. කුසලතා හා විශිෂ්ට දක්ෂතා | 15 |
| 6. පෞරුෂත්වය | 05 |
| **එකතුව** | **100** |

**07. අයදුම්පත් හා අනෙකුත් විස්තර:**

I. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් යොමු කිරීම ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

II. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. රාජ්‍ය සේවයේ නියතු අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

**08. විභාග ගාස්තු:**

විභාග ගාස්තුව රු 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)
iii. ලංකා බැංකුවේ ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

*සටහන:-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

09. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. අධ්‍යාපන සහතික,
III. මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව),
IV. චරිත සහතික දෙකක්,
V. වෙනත් අදාළ සහතික.

10.

I. විභාගය මෙහි උප ලේඛනය 01 හි දැක්වෙන නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පතේ ශීර්ෂයේ පළමු හා දෙවෙනි තේරීම වශයෙන් සඳහන් කළ යුතු ය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

II. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2026.01.05 හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු යි. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. ඉහත සඳහන් විස්තර අදාළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව සංශෝධන සිදුකර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

III. අපේක්ෂයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

IV. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

11. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ

යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බල පත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -

තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම හෝ අවලංගු කළ හැකි ය.

13. අවශ්‍ය අවස්ථාවකදී මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**උපලේඛනය - 1**

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

අධ්‍යක්ෂ ජනරාල්,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

අංක 811/ඒ, ජයන්තිපුර පාර,
බත්තරමුල්ල.

12 - 53/2